(අයුක්තිය හා අසාධාරණය වෙනුවෙන්) යුද්ධ කිරීමේ අධිෂ්ඨානයක් නොමැතිව, යුද්ධය සම්බන්ධයෙන් තමන් කතා නොකර කවරෙකු මිය ගියේ ද ඔහු කුහකත්වයේ කොටසක් මත මියැදුණේය.

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. “(අයුක්තිය හා අසාධාරණය වෙනුවෙන්) යුද්ධ කිරීමේ අධිෂ්ඨානයක් නොමැතිව, යුද්ධය සම්බන්ධයෙන් තමන් කතා නොකර කවරෙකු මිය ගියේ ද ඔහු කුහකත්වයේ කොටසක් මත මියැදුණේය.”
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

යුද්ධ කිරිමට හැකියාව ඇති සෑම මිනිසෙකුම සුදුසු කාලය ළඟා වෙද්දී, එහි යුද්ද නොකර ඒ ගැන කතා නොකර එනම් ඒ ගැන ස්වේච්ඡාවෙන් කතා නොකර එනම් එහි අර්ථය: අසාධාරණය සඳහා ජිහාද්- අරගල කිරීම අධිෂ්ඨාන නොකර සිටින්නේ ද එය කුහකත්වයේ කොටසක් වන්නේය. අයුක්තිය සඳහා ආම්පන්න සූදානම් කිරීම මතුපිටින් පෙනෙන සලකුණකි. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්රකාශ කරයි. “නුඹලා යුද්ධය සඳහා පිටත් වන්නට අධිෂ්ඨාන කළෙහු නම් ඒ සඳහා මනා ලෙස සූදානම් වන්න” “ඔහු කුහකත්වයේ කොටසක් මත මියැදුණේය.” යන ප්රකාශය වනුයේ: එනම් එය කුහකත්වයේ වර්ග අතරින් එක් වර්ගයකි. එනම්: කවරෙකු ඒ මත මිය ගියේ ද ඔහු කුහකයින්ට හා යුද්දයෙන් පසුබැස්සවුනට සමාන විය. කවරෙකු යම් කණ්ඩයාමකට අනුකූලව කටයුතු කරන්නේ ද ඔහු ඔහුගෙන් කෙනෙකි. ඒ අනුව දේවත්වය විශ්වාස කරන සෑම කෙනෙකුටම අසාධාරණය සඳහා ජිහාද්-අරගල කිරීමේ අදිෂ්ඨානය අනිවාර්යය වන්නේය. යුද වැදීම යනු: යුද්ධ කිරීමේ හා ජිහාද් කිරීමේ කොන්දේසි තිබී ඒවා පූර්ණවත් වූ විට ඒ අනුව කටයුතු කිරීමය. එසේ නැතහොත් ජිහාද් සඳහා ඇරයුම් කරන හේතු සාධක සම්පූර්ණ වන තෙක් ඔහුගේ අදිෂ්ඨානය ඉතිරිව පවතිනු ඇත.

https://sunnah.global/hadeeth/si/show/6404